# පහන් වැට

## ගොළුවෙලා

ගත කකියවන හිමිදිරියෙ ශීත වු තිමිරයේ
අරුණැල්ල සිපගත්දි මිහිතලය සෙනෙහසින්
දකින්නට ඇගේ වත මුව පිරුණු හසරැල්ල
වෙහෙසකර මගේ නෙත් යුහුසුළුයි, මාවතේ
විකසිතයි මගේ හද යදින්නට ආදරේ
ගොළුවෙලා මගේ මුව පවසන්න මා පැතුම්
පැකිලෙයි මගෙ දෙපා නගන්නට ඈ වෙතට
බය දැනෙයි, සිත පෙලයි
පැවසුවොත්, අන් සතුයි මා කියා.

ධර්ම කේ. කොඩිප්පිලි

## සිරිලක විත්ති

ජය ගනු දැක අපේ රණ විරුවන් උතුරේ
රට දැය ගැන සිතන සිත් සතුටින් ඉතිරේ
එනමුදු රටේ යන මග තවමත් අඳුරේ
මුළු දිවයිනම ඔඩු ගිය දදයකි මිතුරේ

අද දිළිඳා ලු ගෙට මැදුරක රජ වේලු
ඉවසන දනා සැනසීමක් ලැබුවාලු
රජ කම් කලත් කල කම් පල දෙනවාලු
මේවා සිදු වුනේ මොන යුගයෙද යාලු

බඩු මිල අඩුද නැත නිමැවුම වැඩිද නැත
අර පිරිමැහුම් හුරු කල පාටක්ද නැත
දූෂණ වලට වග කිව යුතු කෙනෙකු නැත
හොර මැර අපචාර ඕනෑ තරම් ඇත

පැදුරක් එලා ගන්නටවත් නැතිව ඉඩ
ගරු මැති සබේ මැතිවරු නගනවලු හඬ
තව තව සිදු වුනොත් බැරි බර දරන වැඩ
කුරහන් සාටකයෙ තැවරෙනු ඇතිය මඩ

දකුණේ බේද ඇතිවන ඉඩ වැලකීම
රට ඉදිරියට යන මාවත සැලසීම
වැඩිහිටි විනය රැක ආදර්ශය දීම
ඉහලින් සිටින උතුමන්ගේ වගකීම

දිවි පරදුවට ගෙන මව් බිම රකින තුරු
නිරවුල් සිතින් කල යුතු දෑ සිතන තුරු
ගතවුණු අතීතෙන් පාඩම් ලබන තුරු
තවමත් පමා නැත ජනපති මැතිද ගරු

ශ්‍රියා කුමාරසිංහ
නවසීලන්තය



## වියෝගය

නිබඳ ගොළු බවම මිස කිසිත්
පතනු රිසි නොවූ සිත...
හුදකලා සිහිනෙන් මිදී ගත මුත්,
භවිහරණයේ දිගු නින්ද තෙක්
නිදන් ගත කල සිතුම්
පෑල දිග රතු වළා ඇතිරුම් මතින්
රිදුම් දෙන ග්‍රහණයේ බැම් තුලින්
අනන්තය තෙක් දුරට හඹා යයි
සොය සොයා සිත පතන
සංසිඳීමක්...

විද්‍යානි මනතුංග

සිතුවම්
පුණ්‍යා මුණසිංහ

## ඔබ හා මම හැම භවයෙම

හිස් වූ ජීවිත බිම් තීරුවේ
සහරාවක් වූ අතීතයේ,
සුසුමක් ඉකිබිඳ මණ්ඩපයේ
නොසිතූ මොහොතක
මල් මකරන්දය දෝතින් ගෙන
හමුවිය ඔබ මට
සත්තකින්ම
ආදරේ ආරාධනාවෙන්....

සෙනෙහසේ උල්පත වු ඔබ,
මා නෙතේ සැතපුණ ඔබ
හදවතේ රිද්මය වූ ඔබ
ආයාචනාවේ දැහැන් ගත වු ඔබ,
අඳුරේ පාතර - කඳුලේ යා කර
කිම සමුගත්තේ
මටද හොරෙන්..
එනමුදු.......

දෙතැනක වුවත් හදවත් අප අද
නිහඬ රාත්‍රීයේ දෙනෙත් පියාගෙන
කුංකුම අංජන නළලේ තවරා
සඳුන් සුවඳින් පිළිරූ නහවා
හදවත් පවුරේ ලියා තබන්නම්
අමිල ඔබේ නම
නොමැකෙන කුරුටු ගීය සේ....

මා සඟවා තැබු ඔබේ රාජධානියේ
සිහිනයක් වූ සිහින විජිතයේ
දැල්වෙන එකම පහන් සිල සේ
මා සිත අබියස

නිමල ලෙසින් පුදා මතකයන්
පිදූ ආදරේ සෙනෙහෙ දරාගෙන
අතීත සිතුවම් ලයෙහි හොවාගෙන,
නිහඬව ඉන්නම්
හැම භවයෙම
සසරේ....
හුරු පුරුදු ලෙසින්.....

කාන්ති වික්‍රමසූරිය

## ජීවිත නාටකය !

පොඩි පුතු සිනා නැත දැවටෙයි මා අසල
ලොකු පුතු නෙතේ දැවටී ගෙන ඇත කඳුළ
හිම් සඳ රවයි ඉඳගෙන මගෙ දෙන අසළ
දූියණිය පිළි ගනීවිද ෙ මී පු වත සැළ?

මෙය සිහිනයක් දැයි විටකදි මට සිතුණා
සිරුරක් නොමැති මා උඩුගුවනට ඇදුණා
දියණි ය ඇවිත් වැළපෙන බව මට දැණුනා
ගිය වේගයෙන් යළි මා පහළට ඇදුණා

කොඩි වැල් ඇදෙයි සුදු පාටින් වටපිටම
මැලවුණු මුහුණු ඇත තැන තැන නොහඬාම
මෙතුවක් කරපු දේවල් ගැන හිතුවාම
ගෙන යන දෙයක් නැහැ නෙතු පිය වැහුණාම

ජීවිත ගමන හැල හැප්පිලි මත ගෙවුණා
විටකදි රසයි, විටකදි නී රස දැණුනා
දරුවන් ලැබුණු පසු වගකිමක් දැණුනා
කළ හොඳ හැම දෙයම කණපිටටම හැරුණා

දෛවය මෙයයි කුමටද මාදුක් ගන්නෙ"
කළ හැම දෙයම, හිත හොඳිනුයි කර දුන්නේ
කොපමණ හොඳ කළත් නොපිටට පෙරලෙන්නේ
කවුරුන්, කොහොම, කවදද, එය පිළිගන්නේ?

සිටිනා තාක් කල් බැණ බැණ හිටිය අය
ගුනවැල් ගයයි.... මේ මොන පුදුමයද මෙය..?
අවසන් ගමන තව මොහොතින් යා යුතුය
ජීවිතයම අපේ න රී නා ටක ය ක් ය.

අසෝකා දේවසුරේන්ද්‍ර ප්‍රංශය

## ප්‍රිය හිමියනි



ලොවේ ඇස් වසා ඉඳ හිට
නිමේෂකට හමුවු කල,
ලිහා ගන්න බැරි විලසිනි
සිව් නෙත් අපෙ වෙලුනේ,
සුසුම් පොදින් ගෙල තැවරුන,
යොවුන් ගතම උනුම් වන,
විදුලි සැරට වැඩි බලයකි,
ඔබෙ සුසුමෙන් දැනුනේ.

ලගින් ඉඳන් කී දුන් කවි,
බරින් මා මුදා හරිමින
දෙව් ලොවකි එදා ඔබ මගෙ
දෙපා ළඟ තැබුවේ....

දිවි තිබෙන තුරා ඔබ ළඟ
නැවතිලා ඉන්න ආ දින
හද මගේ ගැයූ පෙම් තව
ඔබ නොවේද දන්නේ?

දූ පුතුන් ඔබේ රකිමින,
දුක සැපට ලගින් ඉඳමින,
සප්ත වු ලෙසින් එදවස,
අදත් මම ඔබේ පාමුල

හිතවතුන් සියක් මැද වුව,
තනිකමෙන් දැවේ සියොලඟ
ලෙඩ වෙලා අනේ මගෙ හද
යදී ඔබෙ ඇල්ම, බැල්මම

ප්‍රිය සබඳ අනේ මේ ලෙස,
ඇල් මරනු ඇයිද අප පෙම,
එදා ඔබ දුන්නු විලසම
අදත් මට දෙනනේ උණුසුම්

සුභාෂිනි හේරත් ඇටිවුඩ්

## යතාර්ථය

දැඩි කරගත් සිතින්
තරවටු කරමි මම
ඇසිපියන් වලට
නළියන කඳුළු කැට
නොහලන්නැ'යි
සමුගන්න යැදි සිතට
සමු දිය යුතුව ඇත
ගෙවුණු දින කීපය දෙස
අපසු හැරී බැලුවද
ඉතිරිව නැත කිසිත්
මගේමැ'යි මට
වැළඳ ගැනුමට

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය

## අපේ ආදරේ

ඔබට මතක
මටද මතක
අපේ ආදරේ
පුංචි කතන්දරේ

සෙනෙහසින් එදා
ඔබට ළංවෙලා
ආදරේ කියූ එවදන්
නෑ වෙනස් වෙලා

සසරේ පැතූ
පැතුමක් ලෙසින්
ඔබ මා හමුවී
ගෙවිච, ජීවිතේ
විසිපස් වසරක් උදාවෙලා.

භවයෙන් භවේ
අපි අපේ වෙලා
හමුවන්න සැමදා
පතමු පැතුමන් ඉතිං
සෙනෙහේ සිතින් සදා

චන්දි මාපා
Airport West Vic -3042

## වියෝ වු මල්ලී... ට

නුඹ යැයි කියු සකි සඳ මට
නැත සිටියේ අද දවසේ මට
ලොවක් රජ යන දවස ගෙන අද
නුඹට දුන්නේ මගේ හද ගැබ

නමුත් පාරන සිතුවිලි ඔබ
රඳා ගන්නේ ඔබේ හද ළඟ
ඒත් ඉවසා ගත්ත ඔබ සඳ
සුසුනිඳු කළා ඔබේ වත ගොත

නැගෙන හිරුතෙක් බැස යනන අදතෙස
අසන්නට ඇති ඔබගේ දුක් මට
කරන්නට හැකි සෑම විටදීම
මම කළා යැයි සිතුණේ නෑ මම

ඒත් නුඹ දනී මගේ වත ගොත
උපරිම වන්නට කලා හැම දින
වැරදි හැම තැන මගත් පෙන්වා
දිරිය දුන්නේ මගේ (සකි) සඳ

දේහධාරී ලෙස පෙනුන මට
අසරණ වෙද්දී සිටියෙ නුඹ මට
හයිය හත්තිය හිතේ තියාගෙන
දුන්නු ඔවදන් හිතේ රැඳෙයි මට

මටත් නොකියා සැඟවුනිද ඔබ
කාටත් නොපෙනෙන දිගන්තයේ නුඹ
කිසිදා අත් නොවන ''ඉරණම''
ආයිත් කිසි දින නොවේ ඔබ හට

පැතුම් පුරෝගෙන මල් මිටක් ගෙන
මගෙන් වෙන්වී යන්නද හදන්නේ
කොහොම ඉවසන් ඉන්න මගේ හද
''මල්ලී'' නැමැති මගේ දෙඅත් නොමැති මට.

නිලාන් මාගම්පිටිය
"ශෑහය්ව

## අපේ කැදැල්ල

මවුපිය සෙනෙහසින් විකසිත වූ ලොවට
එක පුෂ්පයක මල් පෙති මෙන් බැඳි එකට
ගුණ ඥාන බලය විහිදුවමින් යහමගට
දරු සිවුදෙනා ඇති දැඩි විය සුරතලට

පහන් ටැඹක් විය ලොකු පුතු කැදැල්ලට
බාධක කම්කටොලු මැඩ ගෙන පෙරමඟට
අත හිත දෙමින් ගේ දොර බාහිර වැඩට
නිවැරදි ගමන් මඟ ගොස් දිවි එකලුකොට

ලොකුදුව හරිම සරලයි නිහඬයි මෙළෙකයි
ඇය කලු වුනත් මට නිලුපුල් මලක් වගෙයි
කරුණා දයාවෙන් හැම සිත් පැහැර ගනියි
ජය පැරදුම දෙකම එක සේ බෙදා ගනියි

ඉසි කෝ මනා අවගුණ නැති පොඩි පුතුට
පරහිතකාමී බලයෙන් විඳි නෙක සතුට
වෙඬරු පිඩක් ලෙස උණුවෙයි සිත කලට
යාලුවෝ හිත මිතුරු කැළ ඇත ඔහු අවට

පොඩි දුව කඩිසරයි හැම වැඩකට ශූරයි
බාධක ඉදිරියේ නොසැලෙනන ගලක් වගෙයි
හරි පිළිවෙලට වැඩ කටයුතු නිතර කරයි
විලාසිතාවෙන් හැඩ වැඩ වෙන්න හිතයි

යෞවන වියට දරුවෝ පිය තබන විට
ලෝ දහමට අනුව යුතුකම් ඉටු කරන්නට
මවුපිය නැදෑ හිත මිතුරන් ගෙන සතුට
ආසිරි කුසුම් මැද පිවිසිය යුග මඟට

මිනිපිරි මුණුපුරන්ගේ වැඩ අගයන්ට
සුරතල් බසින් දොඩනා බස් අහගන්ට
දුව පැන නටන සෙල්ලම ටික බලන්නට
පිං මදිවුනා පියතුමා ගිය පරලොවට

කාටත් අත නොපා දිවි මග ජය ගන්න
දිව රෑ දෙකේ වෙහෙසව දිරි බල දුන්න
ලැබු සම්පතින් උපරිම සැපයක් දුන්න
ඔබගේ පියා නැත අද පෙරමුණ ගන්න

සාමය සතුට පිරි යුග දිවි ගෙවන්නට
නිදුක් නීරෝගීව දිගු කල් වැජඹෙන්න
දරු මුණුපුරන් යහමග නිසි හරවන්ට
සව් බල ලැබේවා මගෙ දු දරුවන්ට

S. Ratnayake
Clayton

කැටපත් පවුර වෙබ් අඩවියට වසර පහක් සපිරෙයි.
ඔබේ නිර්මාණ අදම කැටපත් පවුරට යොමු කරන්න.
සාහිත්‍යයට පෙම් බඳින නිර්මාණකරුවනි නිර්මාණකාරියනි
www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩවෙන්න අමතක නොකරන්න.